ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 12 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 05 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
----------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

(i.) මුදල් ප්‍රවාහ ප්‍රකාශය.
(ii.) වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය.
(iii.) ශුද්ධ වත්කම්/ ස්කන්ධයේ වෙනස් වීමේ ප්‍රකාශය.
(iv.)

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කිසිඳු හඳුනාගැනීමකින් තොරව සේවක ණය ලේඛණය පදනම් කර ගනිමින් සේවක ණය ලෙජර් ගිණුමේ රු. 185,379 ක අයකර ගතයුතු සේවක ණය ජ'නල් සටහන් අංක 01 මඟින් කපා හැර තිබුණි.

(ආ) ආදායම් ලේඛණයේ ශේෂ හා ඊට අදාල ලෙජර් ගිණුම්හි එම ශේෂ අතර වන වෙනස්කම් පිළිබඳ කිසිඳු හඳුනාගැනීමකින් තොරව වරිපනම්, අක්කර බදු, බදු කුළී හා වෙළඳ බලපත්‍ර ගාස්තු හිඟ ආදායම් රු. 679,776 ක් ජ'නල් සටහන් අංක 1 මඟින් ලෙජර් ගිණුම් වලින් කපා හැර තිබුණි.

(ඇ) ආරම්භක මුදල් ශේෂය, බැංකු ගිණුම් ශේෂය සමඟ වන රු. 13,611 ක වෙනසට හේතු හඳුනාගැනීමකින් තොරව ජ'නල් සටහන් අංක 01 යටතේ සමුච්චිත අරමුදල මඟින් ගැලපීම් කර තිබුණි.

(ඈ) පෙර වර්ෂයන් හීදී බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ණය හා ප්‍රදාන ලැබීම් හා එම ණය හා ප්‍රදාන මඟින් වියදම් කිරීම, ප්‍රදාන මුදල් ගිණුම් වලින් බැහැරව පොදු තැන්පත් ගිණුම මඟින් සිදුකර ඇති අතර, පසුගිය වර්ෂයට අදාල වන එම වියදම් රු. 36,531,540 ක් සමාලෝචිත වර්ෂයේ වියදමට ගෙන තිබුණි. තවද, ඉකුත් වර්ෂයන්ට අදාලව ලැබී ඇති රු. 23,568,735 ක ප්‍රාග්ධන ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් ලෙජර් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් ශේෂය අතර රු. 46,696 ක වෙනසක් විය.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායම් ලෙස දක්වා තිබූ අක්කර බදු ආදායම් ආරම්භක ශේෂය රු. 192,662 ක් සමාලෝචිත වර්ෂයේ ගිණුම් වලට පිටපත් කිරීමේදී අත්හැරී තිබූ අතර, එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ බිල්කල ආදායම යටතට ගෙන තිබුණි.

(උ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවිය යුතු එකතු කල අගය මත බදු මුදලක් නොතිබුණද, ලෙජර් ගිණුම අනුව රු. 2,238,185 ක එකතු කල අගය මත බදු වගකීමක් විය.

(ඌ) තැන්පත් ආපසු ගෙවීම් රු. 96,215 ක් ණයගිම් ගෙවීම් යටතට ගැනීම හේතුවෙන් සාරාංශ වියදම් ලේඛණයේ ණයගිම් ගෙවීම් හා ලෙජර් ගිණුමේ එම වටිනාකම අතර වෙනසක් විය.

(එ) පසුගිය වසරට අදාලව කර්මාන්ත සඳහා රැඳවුම් මුදල් ගෙවීම තැන්පත් යටතේ සිදුකල යුතු වුවද, කර්මාන්ත 05 කට අදාලව රු. 97,124 ක රැඳවුම් මුදල් ගෙවීම සමුච්චිත අරමුදල මඟින් සිදුකර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයන් වෙනුවෙන් වෙන් කරන ලද රු. 4,556,613 ක ණයගිම් ශේෂය නිරවුල් කිරීම සම්බන්ධයෙන් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

### 1.3.3 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම අනුව ශේෂයන්හි එකතුව රු. 6,727,373 ක්වූ අතර, උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව රු. 11,136,311 ක් වූයෙන් එම වෙනස රු. 4,408,938 ක් විය.

### 1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| | <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - 1992</u> | |
| (I) | මුදල් රෙගුලාසි 371 (2) (ඇ) සහ 371 (5) | 1995 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාල එකතුව රු. 204,249 ක් වූ අත්තිකාරම් මුදලක් යොමුගත රෙගුලාසි ප්‍රකාරව පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි 371 (2) (ආ) | 2014 ජනවාරි 20 දින වන විටත් එකතුව රු.1,253,639 ක් වූ අතුරු අග්‍රිම පියවා නොතිබුනි. |
| (III) | මුදල් රෙගුලාසි 396(ඇ) | නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ක කාලය ඉක්මවන ලද එකතුව රු. 791,347 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ මෙහෙයුම් අයභාරය රු. 1,522,906 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ මෙහෙයුම් අයභාරය රු. 164,609 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය සියයට 825 කින් වැඩිවී ඇති අතර, පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් වැඩිවීම ඊට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 7,613 | 7,670 | 7,979 |
| බදු කුලී | 7,186 | 4,087 | 729 |
| බලපත්‍ර ගාස්තු | 2,105 | 578 | - |
| වෙනත් ආදායම් | 24,016 | 23,545 | 8,960 |

#### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා රැස්කල ආදායම සැසඳීමේදී කුළී ආදායමෙහි, බලපත්‍ර ගාස්තු ආදායමෙහි හා සේවා සඳහා ගාස්තු ආදායමෙහි ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල ආදායමෙහි පිළිවෙලින් සියයට 75, 263 හා 232 ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

#### 2.3.3 බදු කුළී

2012 දෙසැම්බර් 28 දින ගැසට් නිවේදනය අනුව කර්මාන්ත බදු පනවා අය කිරීමට නියම කර ඇතත්, සභා බල ප්‍රදේශයට අයත් කර්මාන්ත, වෙළඳ බලපත්‍ර සහ ව්‍යාපාර බදු පිළිබඳව ලේඛණයක් නිසි පරිදි පවත්වා නොතිබුණි.

2.3.4 කඩ බදු

-----------

නව වෙළඳ සංකීර්ණයෙහි නව කඩකාමර බදු දීමේදී බදුහිමියන් විසින් එකවර ගෙවිය යුතු මුදල් (Key Money) නොගෙවීම හේතුවෙන් එම කඩ හිමියන්ට විරුද්ධව සභාව විසින් 2007 වර්ෂයේදී නඩු පවරා තිබූ අතර, එම අයගෙන් සභාවට එදිනට අයවිය යුතු කුළී මුදල රු. 295,750 ක් ද, ගිවිසුම් ඇප හා ඇප තැන්පත් මුදල් ලෙස රු. 130,612 ක් ද, අයවිය යුතුව තිබුණි. නඩු පවරා වර්ෂ 05 ක කාලයක් ගතවී ඇතත් ඒ සඳහා මෙතෙක් අවසන් තීන්දුවකට එළඹ නොතිබූ අතර, එම බදුහිමියන් දැනට මාසික කුළී මුදල් ගෙවමින් කඩකාමර වල තවදුරටත් රැඳී සිටින බව නිරීක්ෂණය විය. කඩකාමර සහ පොළ බදු වශයෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කුළී ආදායම රු. 293,375 ක් විය. ඉන් සියයට 44 ක් වර්ෂයකට වැඩි කාලයක සිට පැවතුණි.

2.3.5 ප්‍රචාරණ දැන්වීම් ගාස්තු

----------------------------

සභා බල ප්‍රදේශය තුල ප්‍රචාරණ දැන්වීම්, ස්ථිර දැන්වීම් පුවරු ආදී වශයෙන් විශාල දැන්වීම් ප්‍රචාරණයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය වුවද, ඒවා හඳුනාගෙන 2012 දෙසැම්බර් 28 දිනැති ගැසට් නිවේදනයේ උපලේඛණයට අදාල ගාස්තු අයකිරීමට සභාව කටයුතු කර නොතිබුණි. තවද, හඳුනාගෙන ඇති අවස්ථා 06 කදී රු. 172,247 ක ආදායමක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.6 ජල ගාස්තු

--------------

2013 වර්ෂය වෙනුවෙන් සභාවේ ජල ව්‍යාපෘතිය යටතේ ලැබීම් රු. 52,675 ක් වූ අතර, වියදම රු. 89,618 ක් වූයෙන් ව්‍යාපෘතියේ ආදායමෙන් නඩත්තු වියදම පවා දරා ගැනීමට නොහැකි මට්ටමක පැවතුණි. 2013 දෙසැම්බර් 31 දින වනවිට රු. 90,385 ක හිඟහිටි ආදායමක් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පැවතුණි. වර්ෂ ගණනාවක් තිස්සේ පවතින එකී හිඟහිටි ආදායම් අයකර ගැනීමට විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

2.3.7 වෙනත් ආදායම්

-------------------

(අ) 2011 අගෝස්තු 23 දින පැවති සභා රැස්වීම් වාර්තාව අනුව නගරය තුල ප්‍රසිද්ධ ස්ථාන වල නවතා තබන වාහන සහ භාණ්ඩ බෙදාහරින වාහන සඳහා ගාස්තුවක් අය කිරීමට තීරණය කර තිබූණද ගාස්තු අය කිරීම විගණිත දිනය වූ 2014 ජනවාරි 20 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ගැටහැත්ත ගවමස් වෙළඳසැල බදු දීමට ලබාගත් මිල ගණන් අතරින් පළමු හා දෙවන ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර ප්‍රතික්ෂේප කලද, තෙවන ටෙන්ඩර්කරු ඉදිරිපත් වී සිටියදී ඒ සඳහා ටෙන්ඩරය ප්‍රදානය කිරීමට කටයුතු නොකිරීම නිසා සභාවට ලැබිය යුතු රු. 961,404 ක ආදායමක් අහිමි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 ජනවාරි මාසයේ සිට බැංකු සැසඳුම හා මුදල් පොත අතර, පවතින රු. 12,141 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2007 අප්‍රේල් 03 දින මාර්ග තලනය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු. 350,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබූ අතර, එම මාර්ග තලනය 2010 වර්ෂයේදී වෙන්දේසි කර තිබියදීත් අත්තිකාරම් මුදල පියවා ගෙන නොතිබුණි.

(ඇ) මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ රු. 434,805 ක් වටිනාකමැති ද්‍රව්‍ය මිලදී ගෙන තිබූ අතර, ද්‍රව්‍ය ආධාර ලබා දීම සඳහා ප්‍රතිලාභින් තෝරාගත් නිර්ණායකයන් සහ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ආයතනයන් තෝරා ගැනීමේ පිරිවිතරයන් කවරේද යන්නද එකී ද්‍රව්‍ය ආධාර මිලදී ගැනීම් සඳහා මිල කැඳවීම්, ටෙන්ඩර් මණ්ඩල තීරණ ආදිය මෙන්ම ද්‍රව්‍ය බෙදා හැරීමට අදාල විධිමත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඈ) පිරිවැටුම් බදු රු. 77,713 ක් හා පරිසර බලපත්‍ර ගාස්තු රු. 6,427 ක් ලෙස එකතුව රු. 84,140 ක් වූ බැර ශේෂයක් අක්‍රිය ගිණුම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්නට ලැබෙන අතර, වර්ෂ 03 ක කාලයක් ගතවී ඇතත්, මෙම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

(අ) නගර සංවර්ධන වැඩසටහනේ වියදම් සඳහා ඉදිරිපත් කර තිබූ රු. 1,482,910 අතිරේක බිල් සඳහා අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වියදමට අදාල බවට නිවැරදි හඳුනාගැනීමකින් තොරව, එසේම කිසිඳු ලේඛණගත සාක්ෂියකින් තොරව වාචික තොරතුරු මත පමණක් පදනම්ව මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ රු. 585,000 ක වියදම්, ණයහිමියන් යටතට ගෙන සමාලෝචිත වර්ෂයේ වියදමට ගලපා තිබුණි.

3.3 නගර සංවර්ධන වැඩසටහන

නගර සංවර්ධන වැඩසටහන වෙනුවෙන් ඇස්තමේන්තුගත වියදම රු. 4,791,500 ක් වූ අතර, එම වියදම් ඇස්තමේන්තුව ඉංජිනේරු විසින් පිළියෙල කල යුතු වුවද, සභාවේ කාර්මික නිළධාරියා පිළියෙල කර සභාපති මඟින් අනුමත කර තිබුණි. ප්‍රසිද්ධ මිල ගණන් කැඳවූ බවට හෝ අදාල ටෙන්ඩර් ඇගයීමකට ලක්කර ටෙන්ඩර් මණ්ඩල තීරණ අනුව කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සිදුකල යුතු වුවත්, එසේ කටයුතු කල බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. කොන්ත්‍රාත්කරුට ගෙවීම් කරන ලද රු. 900,000 ක අත්තිකාරම් මුදල් පියවීමටද කටයුතු කර නොතිබුණි.

3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇහැලියගොඩ වත්ත-කොහිලදෙනියෙහි අක්කර 01 ක පමණ භූමියක ස්ථිර ගොඩනැගිල්ලක් සහිතව 2000 වර්ෂයේ ආරම්භ කර තිබූ කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය දැනට වර්ෂ 06 පමණ සිට නිශ්ක්‍රීය තත්ත්වයේ පැවති අතර, වහලය සඳහා සෙවිලි තහඩු යොදා අඩි 100 ක් පමණ දිගින් යුත් ගොඩනැගිල්ල තුල කසල කරත්ත 02 ක් , විල්බැරෝ 02 ක්, සවල් 02 ක් ඇතුළු අනෙකුත් උපකරණද නිෂ්කාර්යයව ගබඩා කර තිබුණි. තවද, පොහොර සැකසීමේ යන්ත්‍රය ඇතුළු උපකරණ හා මෙවලම් රාශියක් වර්ෂ 06 ක කාලයක සිට නිශ්කාර්යයව දිරාපත් වෙමින් පැවතින කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහාවූ ගොඩනැගිල්ල සහ කොන්ක්‍රීට් ගල් සෑදීමට යොදා ගනු ලැබූ ගොඩනැගිල්ලද ගරා වැටෙමින් පැවතුණි.

(ආ) කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා මුරකරුවකු සහ කම්කරුවකු දෛනිකව සේවයේ යොදවා 2012 සහ 2013 වර්ෂයන්හි රු. 1,057,445 ක වැටුපක් ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතී මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා ගෙනයාම සභාපතිවරයාගේ කාර්යයක් වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.2 අයවැය පාලනය

වැය විෂයයන් 22 කට අදාලව සලසා තිබූ ප්‍රතිපාදන වලින් රු. 5,134,228 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසානයේදී ඉතිරි වී තිබූ අතර, වැය විෂයයන් 05 කට අදාලව සලසා තිබූ ප්‍රතිපාදන වලින් රු. 602,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසානයේදී කිසිඳු වියදමක් නොදරා ඉතිරි වී තිබුණි.

5. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) ආදායම් පරිපාලනය
(iii) අයවැය පාලනය
(iv) මූල්‍ය පාලනය
(v) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය